ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2022

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2005 අංක 04 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ 18 වන වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට රු.1,478,285 ක් වූ බැංකු අයිරාව, මුදල් ශේෂයෙන් හිලව් කර දක්වා තිබීමෙන් ජංගම වත්කම්හි මුදල් හා බැංකු ශේෂය සහ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | විගණනය පෙන්වාදී ඇති අගය බැංකු අයිරාවක් නොවන අතර ගිණුම් ද්විත්වය සම්බන්ධිත (swift facility) වීම හේතුවෙන් මෙම ඍන අගය අනෙක් ගිණුමෙන් මාරුවීමක් සිදුවන බැවිනි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ට අනුව වාර්තා කරන දිනට ඇති මුදල් ශේෂය නිරූපනය වන පරිදි වාර්තාකරන කාලය තුළ මුදල් ගලා එන ප්‍රභවයන් හා මුදල් වියදම් වූ අයිතම නිවැරදිව දක්වා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල රු.10,233 ක එකතු කිරීමේ දෝෂයක් පැවතීම, | අතීතයානුකූලව ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | කාරක ප්‍රාග්ධන විචලතාවය රු.142,007 ක් අඩුවෙන් දැක්වීම, අත්තිකාරම් රු.476,900 ක් මෙහෙයුම් හා ආයෝජන යන ක්‍රියාකාරකම් දෙකෙහිම දැක්වීම හා ආයෝජන පොලී ආදායම රු.54,752 ක් වැඩියෙන් දැක්වීම යනාදී දෝෂයන් විගණනයේදී ආවරණය විය. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව ඉකුත් වර්ෂවලට අදාළ ප්‍රමාණාත්මක වැරදි නිවැරදි කිරීම් වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රතිෂ්ඨානය කිරීමෙන් අතීතානුයෝගීව ගැලපිය යුතු වුවද එකතුව රු.635,768 කට අදාල පෙර වර්ෂ ගැලපීම් අතීතානුයෝගීව ගලපා නොතිබුණි. | ප්‍රමාණාත්මක වැරදි අතීතයානුකූලව ගලපා 2021 දී ඉදිරිපත් කරන ලද බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ යටතේ හඳුනාගත යුතු රු.117,040 ක් වටිනා ඇඟිලි සලකුණු යන්ත්‍රය පුනරාවර්තන වියදම් ලෙස කපාහැර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් දේපල, පිරියත හා උපකරණ අඩුවෙන් හා වර්ෂයේ ඌනතාවය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය නිවැරදි කිරීමට කටයුතු කළද අසාර්ථකවීම හේතුවෙන් අදාළ යන්ත්‍රය පමණක් ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරන ලදි. එය ඇඟිලි සලකුණු යන්ත්‍රය නඩත්තු ක්‍රියාවේ අංගයක්වන නිසා එම වියදම නඩත්තු වියදම් යටතේ ගිණුම් තුළ දක්වා ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 ඡේදය ප්‍රකාරව අයභාර හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනාවරණය කිරීමෙන් තොරව 2022 වර්ෂය තුළදී පාඨමාලා 03 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.4,956,800 ක ආදායමින් රු.2,319,450 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසද | ඉදිරි ගිණුම්කරණ කටයුතුවලදී යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනාවරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

රු.2,637,350 ක් කලින් ලද ආදායමක් ලෙසද ගිණුම්ගත කර තිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු.732,793 ක් වූ ජ'නල් වවුචර් 04 කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ඉකුත් වර්ෂයේදීද මෙවැනි තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර ජ'නල් වවුචර් සඳහා සාක්ෂි නියමිත පරිදි ඉදිරිපත් කලයුතු බව. |
| (ආ) | ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු රු.396,019 ක ශේෂයක් පැවතියද විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයට ගෙවිය යුතු ශේෂය රු.33,002 ක් වූයෙන් රු.363,017 ක නොසැසඳීමක් පැවතුණි. | විවෘත විශ්වවිද්‍යාලය මඟින් එවන ලැබූ ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරන බව. | ආයතන අතර සිදුවන ගනුදෙනු හේතුවෙන් ඇති වන ශේෂ සැසඳීමක් කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ පාඨමාලා 03 ක ආදායම ලෙජර් ගිණුම් අනුව රු.15,442,305 ක් වුවද අදාල උපලේඛන අනුව එම ආදායම රු.14,676,745 ක් වූයෙන් රු.765,560 ක නොසැසඳීමක් පැවතුණි. | TESL පාඨමාලා ගාස්තු ලේජරයේ ශේෂය නිවැරදි වන අතර ජ'නලය ගැලපීමට පෙර අගය උපලේඛනවල පෙන්නුම් කරන බවද, PPE පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු ඉදිරියේදී අතීතයානුකූලව ගැලපීමට කටයුතු කරන බවද, NEW MA TESL පාඨමාලා ගාස්තු ගැලපීමේදී ශිෂ්‍ය සංඛ්‍යාව අධික බැවින් හා ගණනය කිරීම් වඩාත් සංකීර්ණ බැවින් මුදලින් ලද ආදායම හා උපචිත කළ අගයන් පමණක් ගලපනු ලබන බව. | නිවැරදිව ආදායම් ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා රු.8,561,799ක් ගෙවා තිබුණ ද එහි මුහුණත වටිනාකම වූ රු.9,000,000 ක් ආයෝජන ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුම හා භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම් ගිණුම රු.438,201 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ජ'නල් සටහනක් මගින් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුමේ ශේෂය සහ ශේෂ තහවුරු කිරීමේ ලිපියේ ශේෂය ගලපා ඇති බව. | භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සහ පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේදී වැඩිපුර ගිණුම්ගත කර තිබුණු රු.142,008 ක් වූ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම නිවැරදි කිරීමේදී පෙර වර්ෂයේ ආදායමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමින් අඩුකර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාළ ගැලපීම මූල්‍ය ප්‍රකාශන වල අතීතයානුකූලව ගලපා ඇත. | භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සහ පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------- | ------------------ | ------------------------- | --------------- |
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) වගන්තිය හා 2019 ජූලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.108,831,800 ක් ආයෝජනය කර තිබුණි. | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත්තේ ආයතනය විසින් ඉපයූ ආදායම් වන අතර එසේ ආයෝජනය කිරීමට 2015 ජූලි 17 දින පැවති 79 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමැතිය ලබාගෙන ඇති බව. | මුදල් පනත හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | චක්‍රලේඛයට පටහැනිව 2023 මාර්තු 01 දින සිට සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීමට සිටින කථිකාචාර්යවරියක් හා ඔහුගේ කලත්‍රයා සඳහා අදාළ විදේශ ගමනට දින 103 කට පෙර එනම් 2022 නොවැම්බර් 17 දින ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා | ඇය විසින් ඉල්ලා සිටි පරිදි 2022 නොවැම්බර් මාසයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගුවන් ටිකට්පත් නිකුත්කර ඇති අතර අදාල කාලසීමාව තුළදී සඳහන් කර ඇති ආකාරයේ සීමා කිරීමක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් හා ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.901,234 ක් වැයකර තිබුණි. | | |
| (ඇ) | 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ පාඨමාල 04 ක් යටතේ පැවැත්වූ විභාග 45 කින් විභාග 12 ක ප්‍රතිඵල නිකුත් කිරීම දින 15 සිට දින 95 ක කාලයක් ප්‍රමාද වී තිබුණු අතර විභාග 04 ක ප්‍රතිඵල 2023 මාර්තු 23 දින වන විටත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පාඨමාලාවලට අදාල ඇගයීම් කටයුතු බොහොමයක් සිදුකරනු ලබන්නේ ආරාධිත දේශක වරුන් මාර්ගයෙන් නිසාත් එම දේශකවරුන් ඉතා කාර්ය බහුල නිසාත් ඇගයීම් කටයුතු සිදුකර ගැනීමේ යම් ප්‍රමාදයක් සිදුවී ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන (Operational Manual) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 වගන්තිය | ක්‍රියාකාරි සැලැස්ම හා එහි ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 2023 ජනවාරි මාසේ ආයතන කළමනාකාර මණ්ඩලය ධුර කාලය අවසන් වූ බැවින් ඊළඟ රැස්වීම පැවැත්වීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම වාර්තා අනුමත කර ගැනීමට නොහැකි වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.17,750,951 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,386,768 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,635,817 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාඨමාලා ගාස්තු ආදායම රු.4,816,382 කින් අඩුවීමද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.2,436,000 කින් අඩුවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනික සංවර්ධන අරමුදලේ පැවති (PGIE Development Fund) රු.3,967,500 ක ශේෂය වසර 07 ක කාලයක සිට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | මෙම මුදල ආයතනයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා උපයෝජනය කිරීමට බලාපොරොත්තු වන අතර එහි මූලික කටයුතු මේ වනවිටත් ආරම්භ කර ඇති බව. | අරමුදල් ස්ථාපිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු සඳහා කළමනාකාරණ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.5,449,707 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභා අනුමැතිය ලද තාවකාලික බඳවාගැනීම් පරිපාටියක් අනුව මෙම පත්වීම් සිදු කර ඇත. මේ සඳහා 2020 දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ස්වයං මූල්‍ය උත්පාදනය යටතේ තාවකාලික අනුමැතියක් ලබා දී තිබුණු බව. | විධිමත් අනුමැතිය මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සිදු කල යුතු බව. |